තොරතුරු මාසිකය

2023 සැප්තැම්බර්
ජනතා විමුක්ති පෙරමුණේ
අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි.

# විමර්ශන

ලෝකය වෙනස් කිරීමට වෙනස් වෙමු!

# ආර්ථිකය හැකිළීම හා සංවර්ධනය

**ලංකාවේ ආර්ථිකය තව දුරටත් ගොඩ ගත නොහැකි බව 2023 පසුගිය මාස හයක් වැනි කාලයක් තුළදීත් නැවත නැවතත් තහවුරු කර ඇත. ලංකාවේ ආර්ථික අර්බුදයට පෙනෙන මානයක විසඳුමක් නොමැති බව මේ වසරේ පසුගිය මාස හයක කාලය තුළ ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා දත්ත තුළින් නැවතත් තහවුරු කරමින් පවතී. එය අංශ කිහිපයක ආර්ථික දත්ත ඇසුරෙන් අවබෝධ කරගත හැකිය.**




ලංකාවේ ආර්ථිකය තව දුරටත් ගොඩ ගත නොහැකි බව 2023 වසරේ පසුගිය මාස හයක් වැනි කාලයක් තුළදීත් නැවත නැවතත් තහවුරු කෙරෙමින් තිබේ. ලංකාවේ ආර්ථික අර්බුදයට පෙනෙන මානයක විසඳුමක් නොමැති බව මේ වසරේ පසුගිය මාස හයක කාලය තුළ ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා දත්ත තුළින් නැවතත් තහවුරු කෙරෙමින් පවතී. එය අංශ කිහිපයක ආර්ථික දත්ත ඇසුරෙන් අවබෝධ කරගත හැකිය.

ලංකාවේ ආර්ථිකය විදේශ වෙළෙඳාම මත එනම්, ආනයන සහ අපනයන මත රඳාපවතින බව නොරහසකි. දශක ගණනාවක සිට පවතින මේ විදේශ වෙළෙඳමේ අවාසිසහගත තත්ත්වය මේ මොහොත වනවිට විකෘතිසහගත තත්ත්වයක් දක්වා වර්ධනය වී තිබේ. එය පහත 01 වගුව මගින් පැහැදිලි වේ.

| විදේශ වෙළෙඳාම - 2023 ජන - ජුනි දක්වා (01 වගුව) | | | | |
|---|---|---|---|---|
| විස්තරය | 2022 | 2023 | පසුගිය වසරේ මුල් මාස හයට වඩා වෙනස | % |
| අපනයන එ. ජ. ඩො. මි. | 5,273 | 4,865 | -408 | -7.7 |
| ආනයන එ. ජ. ඩො. මි. | 8,801 | 6,791 | -2,010 | -22.8 |
| පාරිභෝගික භාණ්ඩ | 1,354 | 1,241 | -113 | -8.3 |
| අන්තර් භාණ්ඩ | 5,842 | 4,572 | -1,270 | -21.8 |
| ආයෝජන භාණ්ඩ | 1,603 | 971 | -632 | -39.4 |
| වෙනත් | 2 | 7 | +5 | |
| වෙළඳ ශේෂය එ. ජ. ඩො. මි. | 3,528 | 1,925 | 1,602 | +45.0 |

මේ අනුව පැහැදිලි වන්නේ අපනයන 7.7%කින් අඩු වන විට ආනයන 22.8%කින් අඩු කර ඇති බවයි. ඒ අනුව විශාල ආනයන සීමා කිරීමකින් පසුව වෙළෙඳ හිඟය පසුගිය වසර මුල් මාස හයට වඩා ඩොලර් මිලියන 1,602කින් අඩු කර ගත හැකි වී තිබේ. එහෙත්, මෙලෙස ආනයන සීමා කිරීම මගින් ආර්ථිකයේ නිෂ්පාදනය අඩපණ වී තිබේ. එය අන්තර් භාණ්ඩ 21.8%කින් සහ ආයෝජන භාණ්ඩ 39.4%කින් ආනයන අඩු කිරීම මගින් පිළිබිඹු වේ. ආර්ථිකය තව දුරටත් හකුළුවා අර්බුදයට විසඳුම් සෙවීමේ අසාර්ථක ක්‍රියාමාර්ගයේ ආණ්ඩුව තවමත් නිරත වෙමින් සිටී.

මෙයට සමගාමීව ආර්ථිකයේ ඉදිකිරීම් අංශයද විශාල කඩාවැටීමකට ලක්වෙමින් පවතී. එය ලංකාවේ සිමෙන්ති නිෂ්පාදනය සහ ආනයනය මගින් පැහැදිලි කළ හැකිය. පහත සටහනින් දැක්වෙන්නේ මුල් මාස හය තුළ සිමෙන්ති භාවිතයට ගැනීම අඩුවී ඇති ආකාරයයි.

| සිමෙන්ති භාවිතය - 2023 ජන - ජුනි (02 වගුව) | | | |
|---|---|---|---|
| | 2022 | 2023 | % |
| දේශීය සිමෙන්ති නිෂ්පාදනය මෙ. ටො. දහස් | 1,845 | 1,278 | -31% |
| සිමෙන්ති ආනයනය මෙ. ටො. දහස් | 1,010 | 528 | -48% |
| එකතුව | 2,855 | 1,806 | 37% |

ඉහත වගු අංක 02ට අනුව සිමෙන්ති නිෂ්පාදනය සහ ආනයනය ඉතා දරුණු ලෙස අඩුවී ඇති අතර, එමගින් පිළිබිඹු වන්නේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ඇතිවී තිබෙන දරුණු පසුබෑමයි. ඉදිකිරීම් අංශයේ මෙම කඩාවැටීම ආර්ථිකය තුළ ඍජු සහ වක්‍ර රැකියා විශාල ප්‍රමාණයක් අහිමි කිරීමට හේතු වී තිබේ.

එලෙසම රාජ්‍ය මූල්‍ය අංශයද ඉතා අර්බුදකාරී තත්ත්වයකට පත්ව තිබේ. ජනතාවට බදු පිට බදු පනවා

07 පිටුවට

# රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පිළිබඳ
## කෙටි හැඳින්වීමක්



**ඈත අතීතයේ පටන් ලෝකයේ අධිරාජ්‍යයන්, රාජ්‍යයන් සහ වෙනත් පාලන ඒකක එවැනිම වෙනත් පාලන ඒකක සමඟ යුද, වෙළෙඳ, ආගමික යනාදී කරුණු සම්බන්ධයෙන් එකිනෙකා සමඟ සබඳතා පැවැත්වීම සඳහා විවිධ පණිවිඩ යැවීමට, එකඟතා ඇති කර ගැනීමට රාජ්‍ය දූතයන්, දූත මණ්ඩල යොදා ගත් බව ඉතිහාසයේ සඳහන්ය. අපේ රටට මිහිඳු හිමියන්ගේ සහ සඟමිත් තෙරණියගේ පැමිණීමත් ඉන්දියාවේ අශෝක අධිරාජයා සහ ලංකාවේ දේවානම්පියතිස්ස රජු අතර පැවැති මිත්‍රත්වයේ ප්‍රතිඵලයක් ලෙස සිදුවූ බව ප්‍රකට අතර, එය ක්‍රිස්තු පූර්ව 3වැනි සියවස තරම් ඈතකදී අප දෙරට අතර සිදුවූ රාජ්‍යතාන්ත්‍රික කටයුත්තකට නිදසුනකි. එමෙන්ම ශ්‍රී ලංකා රාජ්‍ය දූතයන් වරින්වර රෝමයට, ග්‍රීසියට සහ පර්සියාවට පිටත්කර හැරි බවත් එකල එම දේශයන්හි පාලකයන්වූ ක්ලෝඩියස්, හෙරක්ලිටස්, අනුෂර්වන් යන අය එම දූතයන් පිළිගත් බවත් වාර්තා වී තිබේ.**

### නූතන සබඳතාවල ආරම්භය

නූතන රාජ්‍යතාන්ත්‍රික සබඳතාවල ආරම්භය ලෙස සැලැකෙන්නේ 1648දී අත්සන් තැබුණු 'වෙස්ට්ෆේලියන්' සාම ගිවිසුම බවට සඳහන්. එය අත්සන් තබන ලද්දේ යුරෝපයේ ස්පාඤ්ඤය සහ ඕලන්දය අතර පැවැති අවුරුදු 80ක යුද්ධයත්, යුරෝපීය ජාතීන් ගණනාවක් අතර පැවැති අවුරුදු 30ක යුද්ධයත් නිමා කිරීම වෙනුවෙනි. ඊට පෙර 13 වැනි සියවසේදී උතුරු ඉතාලිය එහිම වෙනත් නගර රාජ්‍ය තුළ ස්ථිර දූත මණ්ඩල (Permanent Embassies) පිහිටුවා තිබූ අතර වර්තමානයේ දක්නට ලැබෙන බොහෝ රාජ්‍යතාන්ත්‍රික සබඳතා පිළිබඳ සම්ප්‍රදායයන් හඳුන්වා දීමේ ගෞරවය ඔවුනට හිමිය. කෙසේ වුවද, වෙසට්ෆේලියන් ගිවිසුම නූතන ජාතික රාජ්‍ය ක්‍රමයේ පදනම ලෙස සැලැකෙන නිසා එමඟින් රාජ්‍යයන් අතර සබඳතා පැවැත්වීම පිළිබඳව ප්‍රධාන මූලධර්ම 04ක් මත පදනම්වූ රාමුවක් හඳුන්වා දෙනු ලැබ ඇති අතර, අද දක්වාම බොහෝ සෙයින් ක්‍රියාත්මක වෙමින් ඇත්තේ එයය. එම මූලධර්ම වන්නේ,

01. ජාතීන්ගේ ස්වයංනිර්ණ අයිතිය (National Self - determination).

02. රාජ්‍ය තාන්ත්‍රික සාකච්ඡා තුළින් යුද ගැටුම් වළක්වා ගැනීම සහ අවසන් කිරීම (Ending wars through diplomatic congresses )

03. රාජ්‍යයන්ගේ ස්වාධිපත්‍යය පිළිගැනීම සහ ඒවා අතර සහජීවනය පවත්වාගෙන යාම (Peaceful coexistence among sovereign states)

04. අනෙකුත් රාජ්‍යයන්හි අභ්‍යන්තර කටයුතුවලට අතපෙවීමෙන් වැළැකීමේ ප්‍රතිපත්තිය පිළිගැනීම සහ රාජ්‍යයන් අතර බලතුලනය පවත්වා ගැනීම (Maintaining balance of power and acceptance of the principles of non-interfererance in the internal affairs of other sovereign states)

රාජ්‍යතාන්ත්‍රික සබඳතා පිළිබඳ වියානා සම්මුතිය (Vienna Convention on Diplomatic Relations)

රාජ්‍යතාන්ත්‍රික ගනුදෙනු සහ මුක්තීන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවේදී 1961 අප්‍රේල් මස 14 වැනි දින වියානා නුවරදී සාමාජික රාජ්‍යයන් මෙම සම්මුතියට අත්සන් තබන ලදී. එක්සත් ජාතීන්ගේ සාර්ථකම ගිවිසුම ලෙස සැලැකෙන මෙමගින් තානාපතිවරුන් ඇතුළු කාර්ය මණ්ඩල පත්කිරීම සහ ඔවුන් පිළිගැනීම, ඔවුන්ට නිදහසේ කටයුතු කරගෙන යාමට අන්‍යෝන්‍ය වශයෙන් පහසුකම් සැලැසීම, රාජ්‍යතාන්ත්‍රික මුක්තිය, කාර්යාල සහ නිවාස දේපළ අත්පත් කර ගැනීම සහ පවත්වාගෙන යාම යනාදී කරුණු පිළිබඳව ඉතා පුළුල් ලෙස විධිවිධාන සලසා තිබේ.

එලෙස අත්සන් කරන ද්විපාර්ශ්වීය හෝ බහුපාර්ශ්වීය ජාත්‍යන්තර සම්මුතීන් නැවත එක් එක් රාජ්‍යයන් සිය ජාතික නීති පද්ධතියට ඇතුළත් කළ යුතුය. මෙය අපරානුමත කිරීම (ratify) ලෙස හැඳින්වේ. ඒ අනුව ශ්‍රී ලංකාව විසින්ද ඉහත ප්‍රඥප්තියේ විධිවිධාන ශ්‍රී ලංකාව තුළ බලාත්මක කිරීම සඳහා නීති සම්මත කරනු ලැබ තිබේ. මෙම කෙටි සටහන තුළ පහත දැක්වෙන ප්‍රධාන කරුණු කිහිපයක් පමණක් සැලකිල්ලට ගනිමු.

- තානාපතිවරයකු හෝ මහ කොමසාරිස්වරයකු (පොදු රාජ්‍ය මණ්ඩලයීය සාමාජික රාජ්‍යයන්හි 'තානාපති' තනතුර හඳුන්වන්නේ 'මහ කොමසාරිස්' නමිනි. ඒ හැර තානාපති හෝ මහ කොමසාරිස් යන තනතුරු අතර කිසිදු වෙනස්කමක් නැත) එක රාජ්‍යයකින් අනෙක් රාජ්‍යයට නම් කිරීමේ නිදහස එකී රාජ්‍යයන්ට තිබෙනවා. එසේ නම් කිරීමෙන් පසුව මුලින්ම සත්කාරක රටෙහි (Host - State) එකඟතාව සඳහා යැවිය යුතු වේ. ඒ සඳහා පූර්ණ බලය රටක රාජ්‍ය නායකයා සතු වන අතර වෘත්තීය විදේශ සේවයෙන් මෙන්ම ඊට බාහිර පුද්ගලයන්ද ඒ සඳහා තෝරා ගැනේ. එසේ නම් කෙරෙන බොහෝ අවස්ථාවලදී සත්කාරක රටෙහි එකඟතාව ලැබෙන අතර, කලාතුරකින් එසේ නොවන අවස්ථාද දක්නට ලැබේ (නිදසුනක් ලෙස මානව හිමිකම් කඩකිරීම්වලට සම්බන්ධ බව දක්වමින් කැනඩාව විසින් අප රටෙන් නම් කළ විශ්‍රාමික යුද හමුදා ප්‍රධානීන් කිහිප දෙනකු භාර ගැනීම මෑතකදී ප්‍රතික්ෂේප කර තිබීම දැක්විය හැකියි).

- එසේ එකඟතාව ලැබුණු පසු රාජ්‍ය නායකයා විසින් අක්ත පත්‍රයක් (Letter of Credence) ලබාදී අදාළ දූතයා පිටත් කර හරිනු ලබයි. එසේ යන දූතයන් එම අක්ත පත්‍රය සත්කාරක රටේ රාජ්‍ය නායකයාට පිළිගැන්වීමෙන් පසුව පමණක් ඔහු හෝ ඇය නිල වශයෙන් තානාපතිවරයා හෝ මහ කොමසාරිස්වරයා ලෙස පිළිගනු ලබයි. එතෙක් අදාළ පරිදි High Commissioner-designate/ Ambassador-designate ලෙස හඳුන්වනු ලබයි.

● ඔවුනට අදාළ පරිදි His/ Her Excellency යනුවෙන් අමතනු ලබයි. වෙනත් තානාපති නිලධාරීන්ට එලෙස භාවිත කරනු නොලැබේ. නිදසුනක් ලෙස, මෙරට සිටින ඉන්දීය සහකාර මහ කොමසාරිස්වරයාට හෝ කොන්සල් ජෙනරාල්වරුන්ට එසේ ඇමතීම අවශ්‍ය නොවේ. ඒ සඳහා Mr./ Ms. යනුවෙන් භාවිත කෙරේ.

● වියානා සම්මුතියෙහි විධිවිධාන කඩකරමින් යම් තානාපතිවරයකු හෝ වෙනත් රාජ්‍ය තාන්ත්‍රික නිලධාරියෙකු කටයුතු කරන්නේනම් ඔහු හෝ ඇය තවදුරටත් රාජ්‍ය තාන්ත්‍රික දූතයකු ලෙස නොපිළිගන්නා බවට සත්කාර රටේ විදේශ අමාත්‍යාංශයට ප්‍රකාශ කළ හැකිය. එම නිලධාරියා Persona non grata (පිළිගත නොහැකි පුද්ගලයකු) ලෙස නම් කරනු ලබයි. එසේ නම් කොට සති කිහිපයක් තුළ අදාළ නිලධාරීන් සිය රටට කැඳවා ගැනීමට (recall) අදාළ රට කටයුතු කළ යුතුය.

● තානාපති සේවයේ යෙදෙන කාලය තුළ අදාළ දූතයන්ට සත්කාරක රටෙහි අපරාධ නීතියෙන් මුක්තිය (immunity) හිමිවී ඇත. තානාපති කාර්යාල සහ නිවහන් සඳහාද එම මුක්තිය හිමිවේ. කෙටියෙන් පවසතොත්, එම පරිශ්‍ර සඳහා බලපවත්වන්නේ රාජ්‍ය දූතයාට අදාළ රටෙහි නීතිය මිස සත්කාරක රටේ නීතිය නොවේ. නීතියෙහි එය extraterritoriality ලෙස හැඳින්වේ. දේශපාලන හේතු මත රටවලින් පලා යන පුද්ගලයන් තම රටෙහි හෝ වෙනත් රටක තානාපති කාර්යාල පරිශ්‍රයකට ඔවුන්ගේ කැමැත්ත ඇතිව ඇතුළු වීමෙන් පසුව එම පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමට පොලිසියට එම තානාපති කාර්යාලයට ඇතුළු විය නොහැක්කේ එම නෛතික තත්ත්වය අනුවය. නිදසුනක් ලෙස ජූලියන් අසාන්ජේ (Julian Assange) ලන්ඩනයේ ඉක්වදෝර තානාපති කාර්යාලයේ රැකවරණ පැතීමේ සිදුවීම ගත හැකියි.

● රටවලට මෙන්ම ජාත්‍යන්තර සංවිධාන සඳහාද නියෝජිතයන් ලෙස රටවලින් දූතයන් පත් කරනු ලබයි. උදාහරණ ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානයට අපේ නිත්‍ය නියෝජිතයා ලෙස පත්කරනු ලබන නියෝජිතයා ගත හැකියි. ඔහු හෝ ඇය එක්සත් ජාතීන්ගේ නිත්‍ය නියෝජිත (Permanent Representative to the United Nation - PRUN) යනුවෙන් හඳුන්වනවා. නිව්යෝර්ක් සහ ජිනීවා යන නගරවල ඒ වෙනුවෙන් ශ්‍රී ලංකාවේ කාර්යාල පිහිටා තිබේ. ඔවුනටද තානාපති නිලධාරීන්ට තරමටම නොවෙතත්, යම් සීමාවන්ට යටත්ව මුක්තිය හිමි වේ.

● පැරිස් (UNESCO), වියානා (IAEA, UNIDO, UNHCR) සහ කෙන්යාවේ නයිරෝබි (UNEP) නගරවල ඇති අනෙකුත් එක්සත් ජාතීන්ගේ විශේෂිත දූත මණ්ඩල සඳහා එම රටවල සිටින අපේ තානාපතිවරුන්ම PRUN ලෙස සමගාමීව (Concurrently accredited) පත්කරනු ලැබේ. බෙල්ජියමට පත්කොට සිටින ශ්‍රී ලංකා තානාපති බෙල්ජියම් රාජ්‍යයට අමතරව බ්‍රසල්ස් නුවර ප්‍රධාන කාර්යාලය පිහිටි යුරෝපා සංගමය සඳහාද ශ්‍රී ලංකා තානාපති ලෙස පත්කරනු ලැබ ඇත.

## තානාපති කාර්යාල සහ කොන්සල් කාර්යාල

## (Embassies, High commissions and Consulates)

● තානාපති කාර්යාල බොහෝ විට සත්කාරක රටෙහි අගනුවර පිහිටුවනු ලබන අතර, රාජ්‍ය තාන්ත්‍රික, දේශපාලන, ආර්ථික, සංස්කෘතික කටයුතු මෙහෙයවන ප්‍රධාන ආයතනය වේ. ඊට අමතරව එම සත්කාරක රටෙහි සිටින සිය රටවැසියන්ගේ පරිපාලන අවශ්‍යතාද එම තානාපති කාර්යාලයේ අංශයකින් සිදුකරනු ලබයි. ඒවා කොන්සියුලර් කටයුතු ලෙස හැඳින්වේ. උදාහරණ ලෙස යම් රටක වෙසෙන ශ්‍රී ලාංකිකයන්ගේ උපත්, මරණ, විවාහ සහතික නිකුත් කිරීම, සත්‍යාපනය, හදිසි අවස්ථාවලදී රැකවරණ සැලැසීම, සිය රට නැවත පැමිණීමට උපකාරී වීම, නීති කටයුතුවලට හා බන්ධනාගාරගතවූ අයට සේවා සැපයීම, සිය ඥාතීන්ට ඔවුන් ගැන තොරතුරු ලබාදීම එකී කටයුතුවලට අයත් වේ. සත්කාරක රටෙහි හෝ ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලයක් නොමැති යාබද රටක වැසියකුට ශ්‍රී ලංකාවට පැමිණීමට වීසා ලබාදීම ද එම අංශයෙන් සිදුවන කාර්යයකි.

● ඇතැම් රටවල් සිය රටෙහි ජනතාව විශාල සංඛ්‍යාවක් පදිංචිව සිටින රටවල එම ජනතාවගේ එකී සේවාවන් ලබාදීම සඳහා වෙනමම කොන්සල් ජෙනරාල්වරයකු යටතේ කාර්යාලයක් (Consulate) ස්ථාපනය කරන අවස්ථාද පවතී. කොන්සල් ජනරාල් ලෙස විදේශ සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු හෝ වෙනත් අයකු පත්කරනු ලැබේ. එය තානාපති කාර්යාලයේ උප කාර්යාලයක් ලෙස සැලැකිය හැකිය.

නිදසුනක් ලෙස ඔස්ට්‍රේලියාවේ පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය කැන්බරා අගනුවර පිහිටා තිබෙන අතර, කොන්සල් ජනරාල් කාර්යාලය මෙල්බර්න් නුවර පිහිටා තිබේ. මහ කොමසාරිස් කාර්යාලය කැනඩාවේ ඔටාවා අගනුවර සහ කොන්සල් ජනරාල් කාර්යාලය ටොරොන්ටෝ නගරයේ පිහිටා තිබේ. පිළිවෙළින් ඉතාලියේ රෝමයේ සහ මිලානෝහිද, ඉන්දියාවේ නව දිල්ලියේ සහ නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලය චෙන්නායිහිද කොන්සල් ජනරාල් කාර්යාලය මුම්බායිහිද පිහිටා තිබේ.

● යම්කිසි රටක් ලෝකයේ අනෙකුත් සියලුම රටවල් සමග පාහේ තානාපති සබඳතා පවත්වන අතර, විශේෂිත කරුණු යටතේ එසේ නොකරන අවස්ථා පවතී. (නිදසුනක් ලෙස චීනය විරුද්ධ නිසා තායිවානය සමඟ, තලේබාන් පාලනය නිසා ඇෆ්ගනිස්ථානය සමඟ බොහෝ රටවල් තානාපති සබඳතා නොපවත්වයි)

● එසේ වුවද එම සියලු රටවල් සඳහා නේවාසික තානාපතිවරයකු පත්කිරීම හෝ තානාපති කාර්යාල පිහිටුවීම හෝ සිදු කරන්නේ නැත. ඒ, එය ප්‍රායෝගික නොවන බැවිනි. නිදසුනක් ලෙස ශ්‍රී ලංකාව රටවල් 170කට වැඩි සංඛ්‍යාවක රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පවත්වන නමුදු, විශේෂ දූත මණ්ඩල (තානාපති කාර්යාල) පිහිටුවා ඇත්තේ රටවල් 60ක පමණි. යම් රටක නේවාසික තානාපතිවරයා ඊට ආසන්න රටවල් ගණනාවක් සඳහාද අනේවාසික ලෙස පත් කෙරේ. එම තානාපතිවරයා ඒ සෑම රටකටම ගොස් ඒ ඒ රාජ්‍ය නායකයා වෙත වෙන වෙනම අක්ත පත්‍ර පිළිගැන්විය යුතු වේ. නිදසුනක් ලෙස දකුණු අප්‍රිකාවට පත් කෙරෙන ශ්‍රී ලංකා තානාපතිවරයා එහි ප්‍රිටෝරියා අගනුවර නේවාසික වන අතර ඊට ආසන්න ඇංගෝලා, බොට්ස්වානා, එස්වාටිනි (පෙර නම ස්වාසිලන්තය), ලෙසෝතෝ, මලාවි, මොසැම්බික්, නැමීබියා, සැම්බියා, සිම්බාබ්වේ යන රටවල් නවයටම තානාපති වේ. එසේ කිරීම එම රටවලට ප්‍රතීතනය කිරීම (accredit) ලෙස හැඳින්වේ.

එමෙන්ම ලෝකයේ සියලුම රටවල තානාපති කාර්යාල කොළඹ පිහිටුවා නැති අතර, (දැනට කොළඹ පදනම් කරගත් විදේශ දූත මණ්ඩල කාර්යාල 43කි) බොහෝ රටවල ඉන්දියාවට පත්කොට සිටින තානාපතිවරුන් මෙරටද ආවරණය කිරීමට ප්‍රතීතනය කරනු ලබයි. ඇතැම් රටවල් වෙනුවෙන් වීසා කටයුතු නවදිල්ලියේ සිට සිදුවන්නේ එබැවිනි.

● නේවාසික තානාපතිවරයකු නොමැති රටක වෙසෙන සිය රටේ පුරවැසියන්ට හෝ ස්වදේශිකයන්ට කොන්සියුලර් කටයුතු, වෙළෙඳාම්, සංස්කෘතික කටයුතු යනාදී කටයුතු ඉටුකර ගැනීම සඳහා අදාළ රටේ පුරවැසියකු හෝ පුරවැසියකු නොවන ස්වදේශිකයකු එම රට නියෝජනය කිරීම පිණිස නිර්වේතනික කොන්සල්වරයෙකු (Honorary Consul) (වැටුප් හෝ කාර්යාල පහසුකම් නොලබයි.) ලෙස පත් කර ගත හැකිය. එවැනි සුදුසු අයකු ආසන්න රටක පිහිටි අදාළ තානාපති කාර්යාලයෙන් තෝරා නිර්දේශ කොට සිය රටෙහි විදේශ අමාත්‍යාංශයට යොමු කොට විදේශ අමාත්‍යවරයා විසින් පත්කරනු ලබයි. ඔවුනට ඉටුකළ හැකි සේවාවන් ඉතා සීමිත වන අතරම හිමිවන තානාපති වරප්‍රසාදද සීමිතය. සිය නේවාසික තානාපති කාර්යාල පිහිටුවා නොමැති සෑම රටක් වෙනුවෙන්ම නිර්වේතනික කොන්සල්වරයකු (Honorary Consul) පත් කිරීම අත්‍යවශ්‍ය කටයුත්තක් නොවේ.


# මානව පරිණාමය පිළිබඳ නූතන




පැරෑන්ත්‍රොපස් අප්‍රිකාව

## පැරෑන්ත්‍රොපස්

පැරෑන්ත්‍රොපස් යනු වෙනම විශේෂයක් නොව අප මීට පෙර කලාපයෙහි සඳහන් කළ ආකාරයේ ඔස්ත්‍රෙලෝපිතකස් විශේෂයේම උප විශේෂයක් යැයි සමහර විද්‍යාඥයෝ





අදටත් මත පළ කරති. පැරෑන්ත්‍රොපස් විශේෂය 'රොබස්ට් ඔස්ත්‍රෙලෝපිතේසීන්' ලෙසද සමහර තැන්වල සඳහන් වේ ('රොබස්ට්' යන නාමය යොදනු ලබන්නේ 'ශක්තිවන්තයෙක් ලෙස වර්ධනයවූ' යන අදහස සහිතවයි). මොවුන් මිහිමත වාසය කර ඇත්තේ අදින් වසර ලක්ෂ 27ත් - ලක්ෂ 8ත් අතර කාලයේදීය. ගෝරිල්ලකුට සමාන ආකාරයේ හිස් මුදුනක් පිහිටීම (මැදින් ඉස්සුණු දාරයක් වැනි), ශක්තිමත් මාංශ පේශි සහිත් හනු තිබීම, ආහාර හොඳින් අඹරා ආහාරයට ගත හැකි ආකාරයට දත් පිහිටා තිබීම මෙම විශේෂය සතු පොදු ලක්ෂණ වෙයි. ඔස්ත්‍රෙලෝපිතකස් විශේෂවල මෙන්ම මෙම විශේෂයේද ස්ත්‍රී දේහවලට සාපේක්ෂව පුරුෂ දේහ ප්‍රමාණයෙන් විශාලය. එමෙන්ම උරස් ප්‍රදේශයේ ඉහළ කොටස පහළ කොටසට සාපේක්ෂව වැඩි පළලකින් යුතුව පිහිටා ඇත්තේ වත්මන් මිනිසාට වඩා වානරයන්ට සමාන වන ආකාරයටය.

පැරෑන්ත්‍රොපස් විශේෂවල කපාල ධාරිතාව සාමාන්‍යයෙන් ඝන සෙ.මී. 420 - 520 පමණ වේ. මූලික වශයෙන් පැරෑන්ත්‍රොපස් උප විශේෂ 3ක් මේ වන විට හඳුනාගෙන ඇති අතර, ඒවා පැරෑන්ත්‍රොපස් රොබස්ටස් (Paranthropus robustus), පැරෑන්ත්‍රොපස් බොයිසෙයි (Paranthropus boisei), පැරෑන්ත්‍රොපස් ඊතියොපිකස් (Paranthropus aethiopicus) වේ. මෙම විශේෂවලට අදාළ පොසිල අප්‍රිකානු මහාද්වීපයේ නැගෙනහිර සහ දකුණු ප්‍රදේශ ආශ්‍රිතව හමුවී තිබේ.


'පැරා' යනු ග්‍රීක් භාෂාවෙන් ළඟ, එසේත් නැත්නම් අසල්වැසි ආදී අදහසක් ගෙන දෙන අතර 'ඇන්ත්‍රොපස්' යනු මිනිසා යන අදහස ගෙන දේ. වත්මන් මානව පරිණාමයේදී ඊට ආසන්නයෙන්ම පරිණාමය වෙමින් පැමිණි මිනිසෙක් යන අදහස සහිතව පැරෑන්ත්‍රොපස් යන නාමය මෙම විශේෂයට යොදා ඇත. ඒ අනුව පැරෑන්ත්‍රොපස් යනු සෘජුවම අපගේ මුතුන්මිත්තකු නොවන අතර, අපගේ මුතුන්මිත්තකුගෙන් බෙදීගොස් පසුකාලීනව අභාවයට ගිය වෙනත් පරම්පරාවක් ලෙස සැලැකිය හැකිය. (එය අපගේ පියාගෙන් හෝ මවගෙන් පැවතෙන පරම්පරාවක් නොව අපගේ පියාගේ හෝ මවගේ සහෝදරයකුගෙන් හෝ සහෝදරියකගෙන් පැවතෙන පරම්පරාවක් ආදී ලෙස සැලැකිය හැකිය.)

## පැරෑන්ත්‍රොපස් ඊතියෝපිකස් (Paranthropus aethiopicus)



නැගෙනහිර අප්‍රිකානු භූමි ප්‍රදේශවල අදින් වසර මිලියන 2.3ත් - 2.7ත් අතර කාලයේදී පැරෑන්ත්‍රොපස් ඊතියෝපිකස් ජීවත්වූ බවට සාක්ෂි හමුව තිබේ. පැරාඔස්ත්‍රෙලෝපිතකස් ඊතියෝපිකස්, ඔස්ත්‍රෙලෝපිතකස් ඊතියෝපිකස්, ඔස්ත්‍රෙලෝපිතකස් වැල්කෙරි යන් නම්වලින්ද මෙම විශේෂය සමහර







තැන්වල සඳහන්ව තිබේ. අනෙකුත් පැරෑන්ත්‍රොපස් විශේෂ සේම මෙම විශේෂයටද උස් මුහුණක්, ඝන උඩ හනුවක් සහ පළල් චාර්වක දත් පිහිටා ඇත. අනෙකුත් පැරෑන්ත්‍රොපස් උප විශේෂවලට සාපේක්ෂව සැලැකූ විට ඊතියෝපිකස් විශේෂය සාමාන්‍යයෙන් ශරීර ප්‍රමාණයෙන් විශාල වන්නට ඇතැයි සැලැකේ. කපාල ධාරිතාව සාමාන්‍යයෙන් ඝන සෙ.මී. 420ක් පමණ වේ.

ප්‍රථම වතාවට 1968දී මෙම විශේෂයට අයත් පොසිල ඉතියෝපියාවෙන් හමුවූ නිසා 'ඊතියෝපිකස්' යන නාමය යොදා ඇති අතර පසුකාලීනව කෙන්යාව සහ ටැන්සානියාව ආශ්‍රිතවද තවත් පොසිල හමුව තිබේ. පඳුරු සහිත භූමිවල වාසය කළ මෙම විශේෂය වන ලැහැබවල් ආශ්‍රිතවද කාලය ගත කරන්නට ඇතැයි විශ්වාස කෙරේ. ශාක පත්‍ර, ඵල ආදී ශාක ආශ්‍රිත දේ ආහාර වශයෙන් ලබාගත් මොවුහු සුළු වශයෙන් මාංශමය ආහාරද භාවිත කරන්නට ඇත. විශාල චාර්වක දත් මෙන්ම මුහුණේ වැඩුණු මාංශ පේශි ශාක ආශ්‍රිත දේ වඩා හොඳින් අඹරා කෑමට ඔවුන්ට උපකාරී වී ඇත.

පැරෑන්ත්‍රොපස් ඊතියෝපිකස් පරිණාමය වන්නට ඇත්තේ ඔස්ත්‍රෙලෝපිතකස් ඇෆරන්සිස් විශේෂයෙන් යැයි සමහර විද්‍යාඥයන් මත පළකරන අතර, එය එසේ නොව වෙනත්, පොදු පූර්වජයකු හරහා සම්භවය සිදුවන්නට ඇතැයි තවත් සමහරෙක් මත පළ කරති. මොවුන් සමඟ අසල්වැසියන් ලෙස ඔස්ත්‍රෙලෝපිතකස් ගාර්හි වාසය කර ඇති අතර, සමකාලීනව අප්‍රිකාවේ දකුණු ප්‍රදේශයේ ඔස්ත්‍රෙලෝපිතකස් අප්‍රිකානුස් උප විශේෂය වාසය කරන්නට ඇත. එසේම අදින් වසර මිලියන 2.3කට පමණ පෙර පැරෑන්ත්‍රොපස් ඊතියෝපිකස් මිහිමතින් වඳවී යන්නට ආසන්න කාලයේ හෝමෝ හැබිලිස්ද ආසන්න භූමි ප්‍රදේශවල ජීවත් වන්නට ඇත.

# ගවේෂණ


## 02 වන කොටස




### පැරෑන්ත්‍රොපස් බොයිසෙයි (Paranthropus boisei)

බ්‍රිතාන්‍ය ජාතික මානව විද්‍යාඥවරියකවූ මේරි ඩග්ලස් ලීකී විසින් 1959දී ප්‍රථම






වරට මෙම විශේෂයට අයත් පොසිල ටැන්සානියාවේ සිදුකරන ලද කැණීම්වලදී සොයාගන්නා ලදී. මුල් අවධියේ මෙම පොසිල අයත් විශේෂය ෂිංජැන්ත්‍රොපස් බොයිසෙයි ලෙස ඔවුන් විසින් නම් කරනු ලැබුවද පසුකාලීනව එය පැරෑන්ත්‍රොපස් විශේෂයට අයත් යැයි විද්‍යාඥයන් පිළිගැනීමත් සමඟ 'පැරෑන්ත්‍රොපස් බොයිසෙයි' ලෙස නම් කරන ලදී. බ්‍රිතාන්‍ය ජාතික ස්වභාව විද්‍යාඥයකුවූ චාර්ල්ස් වොට්සන් බොයිස්ට ගෞරවයක් වශයෙන් බොයිසෙයි යන නාමය ලබා දී ඇත.

අදින් වසර මිලියන 2.5ත් 1.15ත් අතර කාලසීමාවේදී අප්‍රිකානු මහාද්වීපයේ නැගෙනහිර ප්‍රදේශවල මෙම විශේෂය ජීවත් වන්නට ඇතැයි සැලැකිය හැකි සාක්ෂි හමුව තිබේ. පැරෑන්ත්‍රොපස් ඊතියෝපිකස් විශේෂය පරිණාමය වීමෙන් පැරෑන්ත්‍රොපස් බොයිසෙයි බිහි වන්නට ඇතැයි බොහෝ විද්‍යාඥයෝ මත පළ කර ඇත. කපාල ධාරිතාව ඝන සෙන්ටිමීටර් 450 - 550ක් පමණ වන පැරෑන්ත්‍රොපස් බොයිසෙයි සාපේක්ෂව ඉහළ ඝනකමකින් යුත් හිස්කබලක් සහිත විය. එමෙන්ම කිසිම වානරයකුගෙන් දැකගත නොහැකි ආකාරයේ වැඩිම ඝනකමක් සහිත එනැමලයකින් යුත් චාර්වක දත් බොයිසෙයි සතු විය. (එම චාර්වක දතක් වත්මන් මිනිසෙකුගේ දතක් මෙන් සිව් ගුණයක් පමණ විශාල වේ.) එසේම පැරෑන්ත්‍රොපස් විශේෂයට අයත් උප විශේෂ අතුරින් විශාලම දේහයට හිමිකම් කියනු ලබන්නේද පැරෑන්ත්‍රොපස් බොයිසෙයි වේ. මෙම විශේෂයට අයත් පිරිමි අයකු සාමාන්‍යයෙන් අඩි 5ක් පමණ උසින් යුතු අතර, කිලෝග්‍රෑම් 50 - 60ක පමණ බරකින් යුතු වූ බවටත්, ස්ත්‍රී ලිංගිකයින් අඩි 4ක පමණ උසින් හා කිලෝ ග්‍රෑම් 35ක පමණ බරකින් යුතුවූ බවටත් විශ්වාස කෙරේ.


ඉතියෝපියාව, කෙන්යාව, ටැන්සානියාව ආශ්‍රිතව පැරෑන්ත්‍රොපස් බොයිසෙයි විශේෂයට අයත් පොසිල සොයාගෙන තිබෙන අතර, ඔවුන් අනෙක් පැරෑන්ත්‍රොපස් සහ ඔස්ත්‍රෙලෝපිතකස් විශේෂවලට සාපේක්ෂව වැඩි භූමි ප්‍රමාණයක් පුරා සැරිසරමින් ජීවත් වන්නට ඇතැයි විශ්වාස කෙරේ. ඔවුහු ඇට වර්ග, පලතුරු, ශාක පත්‍ර, අල වර්ග ආදිය ආහාර ලෙස ගන්නට ඇතැයි සැලැකිය හැකි අතර, ගල් ආයුධ සහ ලී දඬු ආදිය භාවිත කරන්නට ඇතැයිද විශ්වාසයක් පවතී. කෙසේ නමුත්, සමකාලීන මානවයන් ගල් ආයුධ භාවිත කර ඇති නිසා එසේ බොයිසෙයි පොසිල සමඟින් සොයාගන්නා ලද ගල් ආයුධ ඔවුන්ම නිපදවූ ඒවාදැයි මෙතෙක් නිවැරැදිව තහවුරු කර නොමැත.

පැරෑන්ත්‍රොපස් බොයිසෙයි මිහිමත විසූ කාලය අතරතුර පැරෑන්ත්‍රොපස් රොබස්ටස්, ඔස්ත්‍රෙලෝපිතකස් අප්‍රිකානුස්, ඔස්ත්‍රෙලෝපිතකස් සෙඩිබා, හෝමෝ හැබිලිස්, හෝමෝ ඉරෙක්ටස්, හෝමෝ රුඩොල්ෆෙන්සිස්, හෝමෝ අර්ගාස්ටර් ආදී විශේෂ ද වාසය කර ඇත.

### පැරෑන්ත්‍රොපස් රොබස්ටස් (Paranthropus robustus)



'ශක්තිවන්තයකු ලෙස වර්ධනයවූ' යන අදහස සහිතව රොබස්ටස් ලෙස නම් කරන ලද මෙම පැරෑන්ත්‍රොපස් උප විශේෂයට අයත් පොසිල, දකුණු අප්‍රිකාවේ ගුහා කිහිපයක් ආශ්‍රිතව සොයාගෙන තිබේ. ප්ලෙයිස්ටොසීන අවධියේ එනම්, අදට වසර මිලියන 2.27ත් 0.87ත් අතර කාලයේ වාසය කරන්නට ඇතැයි විශ්වාස කෙරෙන පැරෑන්ත්‍රොපස් රොබස්ටස්ගේ පොසිලයක් ප්‍රථම වරට සොයාගන්නා ලද්දේ 1938දී දකුණු අප්‍රිකාවේ ක්‍රොම්ඩ්‍රායි ගුහාව ආශ්‍රිතවය. බොහෝ විද්‍යාඥයන් විශ්වාස කරන්නේ පැරෑන්ත්‍රොපස් රොබස්ටස් පරිණාමය වූයේ



පැරෑන්ත්‍රොපස් ඊතියෝපිකස්ගෙන් බවයි. එහෙත් පැරෑන්ත්‍රොපස් ඊතියොපිකස්ගේ පොසිල හමුවන්නේ නැගෙනහිර අප්‍රිකාව ආශ්‍රිතව වීම නිසා දකුණු අප්‍රිකානු කලාපයේ ඊට පෙර මෙන්ම සමකාලීනව සිටි ඔස්ත්‍රෙලෝපිතකස් අප්‍රිකානුස් විශේෂයේ පරිණාමීය ප්‍රතිඵලයක් ලෙස රොබස්ටස් බිහි වන්නට ඇතැයිද සමහර විද්‍යාඥයෝ අදහස් පළකරති.

මූලික වශයෙන් සැවානා පැළෑටි, ශාක වර්ග, අල වර්ග මෙන්ම කෘමි සතුන් ආදියද මෙම විශේෂය ආහාරයට ගෙන ඇති බවටද, ඇට වර්ග සහ ධාන්‍ය වර්ග තළා ආහාරයට ගෙන ඇති බවටද සාක්ෂි ලැබී තිබේ. රොබස්ටස් පොසිල

07 පිටුවට

# ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ගැටලුව

**රටක් සංවර්ධනය කිරීමේ දී ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය සහ අධ්‍යාපනය ඉතා ඉහළ මට්ටමකින් පවත්වා ගැනීම අත්‍යවශ්‍යය. එනම්, උගත්, බුද්ධිමත්, නිපුණතාවලින් යුත්, හැකියාවන්ගෙන් හෙබි සෞඛ්‍ය සම්පන්න, ඉහළ වටිනාකමක් සහිත මානව ප්‍රාග්ධනයක් ගොඩනගා ගැනීම අනිවාර්යය වේ. ඒ අනුව ඕනෑම රටක් සංවර්ධනය කිරීමේ දී ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය ඉතා ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාම කෙරෙහි දැඩි අවධානයක් එරට යොමු කරයි. රටේ ජනතාවගේ සෞඛ්‍යය යනු සම්පූර්ණ කායික, මානසික සහ සමාජයීය සුවතාව ලෙස හැඳින්වේ.**

රටක ජනතාවගේ යහපත් සෞඛ්‍ය තත්ත්වයක් පැවැතීම සඳහා බලපාන සාධක විශාල ප්‍රමාණයක් පවතී. රටක සෞඛ්‍ය සේවාව යනු එම සාධකවලින් එකක් පමණි. අධ්‍යාපනය, පාරිසරික තත්ත්වය, නිවාස, ආහාර සුරක්ෂිතතාව, සමාජ - ආර්ථික තත්ත්වය, ඒකපුද්ගල ආදායම, විරැකියාව, දුප්පත්කම, සෞඛ්‍යය සම්බන්ධයෙන් ජනතාවගේ දැනුම, රැකියා ස්ථානවල තත්ත්වය සහ පුද්ගලයන්ගේ ජානමය ලක්ෂණ සෞඛ්‍යය කෙරෙහි බලපාන අනෙකුත් ප්‍රධාන සාධක වේ.



ඉහත සාධක අතුරින් සෞඛ්‍ය සේවාව යනු ජනතාවගේ සෞඛ්‍යය යහපත් මට්ටමකින් පවත්වා ගැනීම සඳහා අත්‍යවශ්‍ය අංගයක් වේ. ඒ සඳහා සෞඛ්‍ය සේවාවේ සෞඛ්‍ය ප්‍රවර්ධනය (Health Promotion), රෝග නිවාරණය (Health Prevention), ප්‍රතිකාර (Curative Care) සහ සහන සත්කාර (Palliative Care) යන අංශ පහම ශක්තිමත්ව තිබිය යුතුය. සෞඛ්‍ය ප්‍රවර්ධනය යනු ඉහතින් සඳහන් කළ සෞඛ්‍යය කෙරෙහි බලපානු ලබන සාධක යහපත් මට්ටමින් පවත්වාගෙන යාමට අවශ්‍ය තත්ත්වයන් පවත්වාගෙන යාමයි.

පුද්ගලයන් සාතිශය බහුතරයකට උපතේ දී එම පුද්ගලයාගේ ජානමය තත්ත්වය අනුව ඉහළ ආයුෂ කාලයක් ජීවත් වීම සඳහා විභවයක් පවතී. නමුත්, සෞඛ්‍යය තීරණය කරනු ලබන ඉහත සාධක යහපත් මට්ටමින් නොපැවැතුණහොත්, එම පුද්ගලයාට එම ආයුෂ කාලය ජීවත් වීමට නොහැකි වේ.

නවීන වෛද්‍ය විද්‍යාවේ දියුණුවත් සමග වසංගත පාලනය සඳහා එන්නත් සොයා ගැනීම, ප්‍රතිජීවක ඖෂධ සොයා ගැනීම, අනෙකුත් ඖෂධ වර්ග සොයා ගැනීම, මාතෘ සහ ළදරු සෞඛ්‍යය ඉහළ මට්ටමට ගෙන ඒම ආදිය මිනිසාගේ උපතේ දී ආයු අපේක්ෂාව ඉහළ දැමීමට හේතු වී තිබේ.

රටක ජනතාවට යහපත් සෞඛ්‍ය සේවාවක් ලබා දීම සඳහා ප්‍රමාණවත් අරමුදල්, ප්‍රමාණවත් සම්පත් පමණක් නොව නිවැරැදි දැක්මක් සහිත නායකත්වයක් ද තිබිය යුතුය. අද අප රටේ සෞඛ්‍ය සේවාව මෙතරම් බිඳවැටීමට හේතු වී ඇත්තේ, ප්‍රමාණවත් මුදල් ඒ සඳහා වෙන් නොකිරීම නිසා සිදු වන සම්පත් හිඟය සහ රට පාලනය සඳහා නිසි නායකත්වයක් නොමැති වීමය.

මේ දිනවල රට තුළ ඖෂධ පිළිබඳ ගැටලු රාශියක් මතු වී තිබේ. ඖෂධ හිඟය, ඖෂධවල ප්‍රමිතිය බාල වීම, ඖෂධ මිල ඉහළ යාම ඉන් ප්‍රධාන වේ.

අපේ රටට විද්‍යාත්මක ඖෂධ ප්‍රතිපත්තියක් නොමැති වීම ද මෙම ගැටලු උග්‍ර කිරීමට හේතු වී තිබේ. රටකට ජාතික ඖෂධ ප්‍රතිපත්තියක් තිබිය යුතුය. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ජාතික ඖෂධ ප්‍රතිපත්තියක් හඳුන්වා දී තිබේ. ජාතික ඖෂධ ප්‍රතිපත්තියක් මුලින්ම සකස් කරනු ලැබ ඇත්තේ, රටවල් දෙකකය. එනම්, හැත්තෑව දශකයේ දී චිලී රජයේ සැල්වදෝර් අයන්ඩේ සහ ශ්‍රී ලංකාවේ මහාචාර්ය සේනක බිබිලේ විසිනි. ඒ අනුව ලෝක සෞඛ්‍ය සංවිධානය ජාතික ඖෂධ ප්‍රතිපත්තිය සකස් කිරීමේ දී පදනම් කරගෙන ඇත්තේ, මෙම රටවල් දෙක හඳුන්වා දුන් ප්‍රතිපත්තිය. ලෝක සෞඛ්‍ය සංවිධානයේ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය සකස් කිරීමේ කමිටුවේ සාමාජිකයකු ලෙස සේනක බිබිලේ මහාචාර්යවරයාගේ ඝාතනයෙන් පසුව ඖෂධ ප්‍රතිපත්තිය පිළිබඳව උනන්දුවක් දැක්වූ ක්‍රිෂාන්ත වීරසූරිය මහතා කටයුතු කර ඇත.

සේනක බිබිලේගේ ඖෂධ ප්‍රතිපත්තිය පදනම් වී ඇත්තේ, ජනතාවට අවශ්‍ය ඖෂධ සූරාකෑමකින් තොරව ඔවුනට ලබා දීම සහතික කිරීම සඳහාය. ඇමෙරිකා එක්සත් ජනපදයේ වැඩිම ලාභ ලබන සමාගම් 500 (Fortune 500) අතුරින් මුලින්ම තිබෙන සමාගම් වන්නේ ඖෂධ සමාගම්ය. ඒ අනුව ඖෂධ සමාගම් ජනතාව දැවැන්ත සූරාකෑමකට ලක් කරමින් සිටී. අදටත් මෙම තත්ත්වය ලොව පුරාම දක්නට ලැබෙන නමුත්, සමහර රටවල් මෙම සූරාකෑම අවම කිරිමට සඳහා උත්සාහ දරයි.

සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තියේ ප්‍රධාන කාරණා වන්නේ ඖෂධ ආනයනය, ඖෂධ අමුද්‍රව්‍ය ආනයනය, ඖෂධ නිෂ්පාදනය, ඖෂධ බෙදාහැරීම, ඖෂධ අලෙවිය, ඖෂධවල ප්‍රමිතිය පවත්වාගෙන යාම සහ ඖෂධවල මිල පාලනය කිරීම සඳහා රජය මැදිහත් වීම ආදියයි. ඊට අමතරව ඖෂධ පිළිබඳව සෞඛ්‍ය කාර්ය මණ්ඩල සහ ජනතාව දැනුම්වත් කිරීම අඛණ්ඩව සිදු කිරීමයි.

අද වන විට ඖෂධවල මිල පාලනය කිරීම සඳහා රජයේ මැදිහත් වීම අවම වේ. මේ තත්ත්වය හමුවේ ඖෂධ සමාගම් සහ ආනයනකරුවන් විසින් ඖෂධවල මිල තීරණය කරනු ලබයි. මේ නිසා ඖෂධවල සැබෑ වටිනාකම මෙන් හත්-අට ගුණයක මුදලක් ගෙවීමට සමහර අවස්ථාවල දී සිදු වේ.

ඖෂධවල ප්‍රමිතිය පිළිබඳව ද අප රටේ බරපතළ ගැටලු මතු වීමට හේතු වී ඇත්තේ, ඖෂධවල ප්‍රමිතිය පවත්වා ගැනීමේ වගකීම ඇති ජාතික ඖෂධ නියාමන අධිකාරිය ප්‍රමුඛ සෞඛ්‍ය අමාත්‍යාංශය ප්‍රමාණවත් පියවර නොගැනීමය. ඖෂධවල ප්‍රමිතිය පිළිබඳව ප්‍රධාන ගැටලු දෙකක් මතු වී තිබේ. එනම්, ඖෂධවල කාර්යක්ෂමතාව (Efficiency) සහ ඖෂධවල ආරක්ෂිතභාවය (Safety) පිළිබඳවය. මේ සඳහා අප රටට ඖෂධ ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකව විශ්ලේෂණය කළ හැකි පහසුකම්වලින් යුත් නවීන රසායනාගාරයක් අත්‍යවශ්‍ය වේ. අප රටේ ඒ සඳහා ප්‍රමාණවත් පහසුකම් නොමැති වීම නිසා බාල ඖෂධ විශාල වශයෙන් රටට ආනයනය කළ හැකිය. සාමාන්‍ය ලෝකයේ භාවිත කරන ඖෂධවලින් සියයට 14ක් පමණ ඖෂධ බාල ඒවා බවට හඳුනා ගනු ලැබ තිබේ. අප රට වැනි දුප්පත්, පහසුකම් අඩු රටවල මෙම ප්‍රමාණය මීට වඩා ඉහළ අගයක් ගනී.

එසේම අප රටේ සෞඛ්‍යය සඳහා වෙන් කරනු ලබන මුදල්වලින් තුනෙන් එකක පමණ ප්‍රමාණයක් ආණ්ඩුව, සෞඛ්‍ය ඇමැතිවරු ඇතුළු කණ්ඩායම් විසින් වංචා, දූෂණ සහ අක්‍රමිකතා සිදු කරමින්, සොරාකනු ලැබීම ද මෙම ඖෂධ හිඟය උග්‍ර වීමට හේතු වී තිබේ.

## ආර්ථිකය හැකිළීම.......

01 - පිටුවෙන්

රජයේ ආදායම වැඩිකරගත්තද, එම වැඩිකරගත් ආදායමට කුමක් සිදුවීද යන්න ගැටලුකාරීය. රාජ්‍ය ආදායමේ වැඩිවූ කොටසට වඩා විශාල ලෙස රාජ්‍ය වියදම් ඉහළ ගොස් තිබේ. විශේෂයෙන් පුනරාවර්තන වියදම් විශාල ලෙස ඉහළ ගොස් ඇත්තේ රාජ්‍ය වියදම් දරුණු ලෙස කපාහරිමින් තිබෙන තත්ත්වයක් තුළදීය. එය පහත 03 වගුව මඟින් පැහැදිලි කළ හැකිය.

මේ අනුව රජයට තම එදිනෙදා වියදම් පියවා ගැනීම සඳහාවත් ප්‍රමාණවත් ආදායමක් ලබාගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගතවී තිබේ. ඉතා විශාල බදු ප්‍රමාණයක් ජනතාව පිට පටවා තිබියදීත්, ආණ්ඩුවට මෙපමණ මුදලක් වියදම් වීම පසුපස වංචාව, දූෂණය සහ නාස්තිය පිරී ඇති බව පෙනේ. මුල් මාස හයට පමණක් රුපියල් ට්‍රිලියනයක පමණ මූල්‍ය හිඟයක් පැවැතීම රටේ ආර්ථිකය පැත්තෙන් එතරම් සුබදායක නැත.

ආර්ථිකය තුළ ඉන්ධන පරිභෝජනයද පහළ ගොස් ඇති තත්ත්වයක් දක්නට ලැබේ. එය පහත 04 වගුව මඟින් පැහැදිලි වේ.

ඉහත සංඛ්‍යාලේඛනයට අනුව ඩීසල් භාවිතය පසුගිය වසරේ මුල් මාස හයට වඩා 31%කින් අඩුවී තිබේ. පසුගිය වසරේ ඉන්ධන හිඟයක් තිබියදී අලෙවිවූ ප්‍රමාණයවත් මේ වසරේ මුල් මාස හය තුළ අලෙවි නොවීම මඟින් මතු කෙරෙන්නේ ආර්ථිකයේ නිෂ්පාදන අංශයේ දරුණු හැකිළීමම පමණකි.

**ඉන්ධන පරිභෝජනය - 2023 ජන - ජුනි - (04 වගුව)**

| | 2022 | 2023 | % |
|---|---|---|---|
| ඩීසල් විකිණුම් - මෙට්‍රික් ටොන් දහස් | 1,087 | 753 | -31% |
| පෙට්‍රල් විකිණුම් - මෙට්‍රික් ටොන් දහස් | 662 | 607 | -8% |
| භූමිතෙල් විකිණුම් - මෙට්‍රික් ටොන් දහස් | 82 | 34 | -59% |

**රාජ්‍ය ආදායම සහ වියදම - 2023 ජන - ජුනි - (03 වගුව)**

| | 2022 | 2023 | වෙනස රු.බි. | % |
|---|---|---|---|---|
| බදු ආදායම් සහ ප්‍රදාන (රු. බි.) | 919 | 1,317 | 398 | 43% |
| පුනරාවර්තන වියදම් - (රු. බි.) | 1,571 | 2,325 | -754 | 48% |
| හිඟය | 652 | 1,008 | | |

ඉහත සාධක සියල්ල සලකා බැලූ කල ලංකාවේ ආර්ථිකය ක්‍රම ක්‍රමයෙන් හැකිළෙමින් එහි අවසානය කරා ළඟා වෙමින් පවතින බවක් පෙනේ.

## න්‍යායේ හා භාවිතාවේ ඇති වැදගත්කම .......

08 - පිටුවෙන්

*"අපගේ විප්ලවයේදී සිදුවෙන සෑම අත්වැරැද්දක්ම ගැන මුළු ලෝකයටම ඇසෙනසේ දූෂිත ධනපති පුවත්පත් හඬ තැළුවාවේ. අපි අපගේ අත්වැරැදි නිසා දුර්මුඛ නොවන්නෙමු. විප්ලවය ආරම්භවී තිබෙන නිසා මිනිසුන් ශුද්ධවන්තයන්වී නැත. ශතවර්ෂ ගණන් තිස්සේ පීඩිතව හා පෑගී සිටි, දුප්පත්කම, ම්ලේච්ඡභාවය සහ නූගත්කම නමැති දුෂ්චරිතය තුළ බලෙන් ගිල්වනු ලැබ සිටි, වෙහෙසී වැඩ කරන පන්ති විප්ලවයක් කරන විට වැරැදීම් සිදුවීම නොවැළැක්විය හැකිය. මා කලින් පෙන්වා දී ඇති පරිදි ධනපති සමාජයේ මළකුණ පෙට්ටියක බහා ඇණගසා වළලා දැමීමට නුපුළුවන. අප මධ්‍යයේම කුණුවී, දිරාපත් වන ධනපති ක්‍රමයේ මළකුණ වාතය අපිරිසිදු කරයි; අපගේ ජීවිතවලට විෂ කවයි; පැරැණි, මරණාසන්න හා කුණුවන දෙයින් විහිදෙන දහසක් නූල් හා බන්ධනවලින් අලුත්, නැඹුල් සහ පෞරුෂතා සහිත සියල්ල පටළවා තබයි.*

*(ලෙනින් - තෝරාගත් කෘති - 08 වෙළුම, 204-205 පිටු)*

අවසාන වශයෙන් නිර්ධන පන්තිය මතවාදීමය ලෙස සම්බන්ධ වීම පමණක් නිර්ධන පන්තියට තම විමුක්තිය උදාකර ගැනීම සඳහා ප්‍රමාණවත් වන්නේ නැත. ඒ සඳහා ක්‍රියාකාරී වීමද අත්‍යවශ්‍ය වේ. න්‍යායෙන් තොර භාවිතාව අන්ධ බවත්, භාවිතාවෙන් තොර න්‍යාය වඳ බවත් මේ අනුව පැහැදිලිය. එබැවින්, න්‍යායික වශයෙන්වූ එකඟතාව නිවැරැදි ලෙස භාවිතයට නැඟීම සඳහා සංවිධානයවීම අත්‍යවශ්‍යය. විධිමත්, නිශ්චිත වැඩපිළිවෙළක් සහිත විනයකින් යුතු, සංවිධාන මූලධර්මය ලෙස ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතභාවය පිළිගත් පක්ෂයක් නිර්ධන පන්තියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අත්‍යවශ්‍යය. න්‍යාය භාවිතයට නැඟීමට පන්තියට මඟ පෙන්විය යුත්තේ පක්ෂය විසිනි.

## මානව පරිණාමය පිළිබඳ .......

04-05 - පිටුවෙන්

හමුවූ ගුහා ආශ්‍රිතව ගල් ආයුධ මෙන්ම සත්ව අස්ථි මඟින් සාදන ලද මෙවලම්ද සොයාගෙන ඇති අතර, ඔවුන් සිය ආහාර කෑමට ගත හැකි ආකාරයට සකසා ගැනීම සඳහා ඒවා භාවිත කරන්නට ඇතැයි විශ්වාස කෙරේ. කෙසේ නමුත්, මෙම ආයුධ වර්ග ඔවුන් භාවිත කරන්නට ඇතැයි විශ්වාස කළ හැකි වුවද, ඒවා නිපදවන්නට ඇත්තේ පැරැන්ත්‍රොපස් රොබස්ටස් විසින්මද, එසේත් නැත්නම්, සමකාලීන වෙනත් මානව වර්ග විසින්ද යන්න මෙතෙක් නිශ්චිත නැත.

මෙම විශේෂයට අයත් පිරිමි අයකුගේ උස සාමාන්‍යයෙන් අඩි 4යි අඟල් 4ක් පමණ වන අතර, ගැහැනු අයකුගේ උස අඩි 3යි අඟල් 6ක් පමණ වේ. එසේම පිරිමි අයකුගේ බර කිලෝග්‍රෑම් 40ක් පමණ වන විට ගැහැනු අයකුගේ සාමාන්‍ය බර කිලෝ ග්‍රෑම් 30ක් පමණ වන්නට ඇතැයි විශ්වාස කෙරේ. එසේම පැරැන්ත්‍රොපස් රොබස්ටස්ගේ කපාල ධාරිතාව ඝන සෙ.මී. 450 - 550ක් පමණ වන්නට ඇතැයි ගණන් බලා තිබේ. සාමාන්‍යයෙන් වයස්ගතව මියයාමක් වෙනුවට හදිසි තත්ත්වයන් මත රොබස්ටස්ලාගේ මරණ සිදුව ඇති අතර, මෙතෙක් හමුවී ඇති පොසිල සාක්ෂි අනුව උපරිම වයස අවුරුදු 35ක් පමණ වන්නට ඇති බවටද, සාමාන්‍ය ආයු කාලය වසර 17.2ක් පමණ වන්නට ඇති බවටද විශ්වාස කෙරේ. මෙතෙක් සොයාගෙන ඇති අස්ථිවල කොටින්ගේ, හයිනාවන්ගේ ආදී සතුන්ගේ දත් සලකුණු තිබීමෙන් අදහස් වන්නේ රොබස්ටස්ලා බොහෝවිට එම සතුන්ගේ ගොදුරු බවට පත්ව ඇති බවයි. එසේම වැඩිවියට පත්ව නව වර්ගයා බෝ කිරීමේ හැකියාව වයස අවුරුදු 11දී පමණ රොබස්ටස්ලාට ලැබී ඇත.

පැරැන්ත්‍රොපස් රොබස්ටස් විශේෂය ශාක සහිත භූමිවල ජීවත්වීමට වැඩි ඇල්මක් දැක්වුවද, පඳුරු සහිත බිම් ආදී අනෙකුත් වෙනස් බිම් ප්‍රදේශ තුළද වාසය කර ඇත. කෙසේ නමුත්, ප්ලෙයිස්ටොසීන යුගයේ අවසාන අවධියේ සිදුවූ දේශගුණ විපර්යාසවලට මුහුණ දීමට නොහැකිවීම නිසා මෙම විශේෂය මිහිමතින් තුරන් වන්නට ඇතැයි සිතිය හැකිය. මේ දක්වා කාලය තුළ පැරැන්ත්‍රොපස් රොබස්ටස් සමඟ සමකාලීනව පැරැන්ත්‍රොපස් බොයිසෙයි, ඔස්ත්‍රෙලෝපිතකස් අප්‍රිකානුස්, ඔස්ත්‍රෙලෝපිතකස් සෙඩීබා, හෝමෝ හැබිලිස්, හෝමෝ ඉරෙක්ටස්, හෝමෝ රුඩොල්ෆෙන්සිස්, හෝමෝ අර්ගාස්ටර් ආදී විශේෂ ද වාසය කර ඇත.

**තවත් කොටසක් ඉදිරි කලාපයෙන් බලාපොරොත්තු වන්න**

# න්‍යායයේ හා භාවිතාවේ ඇති වැදගත්කම

**අන් කවරදාකටත් වඩා ධනපති ක්‍රමය මෙන්ම ධනේශ්වර දේශපාලන පක්ෂද දැවැන්ත අර්බුදයක ගිලෙමින් තිබෙන මොහොතක බලය ලබා ගැනීම වෙනුවෙන් කටයුතු කරන විප්ලවවාදී ව්‍යාපාරය සිය න්‍යාය සහ එම න්‍යාය භාවිතයට නඟන්නේ කෙසේද යන්න පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම අත්‍යවශ්‍ය කරුණක් බව අවිවාදිතය.**

අනෙක් පැත්තෙන් නිවැරැදි න්‍යාය ඇත්තේ තමන් සතුව බවත්, එය භාවිතයට නඟන්නේ මෙසේ යැයි පාරම්බාමින් කටයුතු කරන අවස්ථාවාදී වංචනිකයන්ගේ උගුල් පිළිබඳව වඩා නිවැරැදි ලෙස වටහා ගැනීම ද අනිවාර්යයකි. සමාජවාදී සමාජය ගොඩනැඟීම සඳහා විප්ලවීය න්‍යාය තෝරා ගැනීම මෙන්ම එය භාවිතයට නැඟීම සිදු කළ යුත්තේ කෙසේදැයි සාකච්ඡා කිරීම මෙම ලිපියේ අරමුණයි.

විප්ලවවාදී ව්‍යාපාරයකට නිශ්චිත උපායමාර්ගයක් මෙන්ම ඒ ඒ මොහොතවල්වලට අදාළ උපක්‍රම තෝරා ගනිමින් ඉදිරියට යාමට ඊට මඟපෙන්වන විප්ලවීය න්‍යායක් අවශ්‍ය වේ. විප්ලවීය න්‍යායයෙහි මඟ පෙන්වීමකින් තොරව උපක්‍රම තේරීමේ දී ප්‍රායෝගිකවාදයට ඇදවැටීමේ අනතුර මතු වේ. එසේම විප්ලවවාදී ව්‍යාපාරයක් තම න්‍යාය පවතින තත්ත්වයන් තුළ භාවිතාවට නැඟීමට ද සමත් විය යුතු ය. භාවිතයට නොනඟන න්‍යාය මඟින් පොතේගුරුවාදය හා විප්ලවවාදී වාග් පාඨ දෙඩවීමේ කුෂ්ඨ රෝගය (ලෙනින් කියූ ලෙස) මතු වනු ඇත.

ලෙනින් සහෝදරයාගේ පහත උපුටා ගැනීම්වලින් න්‍යාය මෙන්ම එම න්‍යාය භාවිතයට ගැනීමේ වැදගත්කම පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබාගත හැකිය.

*"විප්ලවීය න්‍යාය නොමැතිව විප්ලවීය ව්‍යාපාරයක් තිබිය නොහැකි ය. ඉතාමත් පටු ප්‍රායෝගික ක්‍රියාකාරීත්වයේ මෝහනයක් සමග අතින'ත් ගෙන අවස්ථාවාදයේ හැඩකාර දේශනා පැවැත්වීම කෙරෙන මෙවැනි කාලයක මෙම අදහස කොතරම් අවධාරණය කළත් වැඩි නැත."*

*(ලෙනින් - තෝරා ගත් කෘති - 01 වෙළුම, 136 පිටුව)*

*"අපට මෙහි දී සඳහන් කිරීමට අවශ්‍ය වන්නේ පෙරමුණු සටන්කරු කාර්යභාරය ඉටු කිරීමට හැක්කේ ඉතාමත් දියුණු න්‍යායෙන් මඟපෙන්වීම ලබන පක්ෂයකට පමණි."*

*(ලෙනින් - තෝරා ගත් කෘති - 10 වෙළුම, 137 පිටුව)*

න්‍යාය ඇදහිල්ලක් නොවන බවත් න්‍යාය සහ භාවිතාව අතර සම්බන්ධයේ ස්වභාවය පිළිබඳව ලෙනින් පවසා ඇත්තේ මෙසේ ය:

*"නිවැරැදි විප්ලවවාදී න්‍යායක් තිබීම එම කොන්දේසි නිර්මාණය වීමට පහසුවක් වන නමුත්, න්‍යාය ඇදහිල්ලක් නොවන්නේ ය. න්‍යාය එහි අවසාන හැඩහුරුව ලබන්නේ සැබැවින්ම පොදුජන සහ සැබැවින්ම විප්ලවවාදී ව්‍යාපාරයක ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය හා සමඟ සමීප සම්බන්ධයක් ඇතිව පමණකි."*

*(ලෙනින් - තෝරා ගත් කෘති - 10 වෙළුම, 135 පිටුව)*

වඩා විප්ලවීයම න්‍යාය ඇත්තේ තමන් සතුව බවත්, නිවැරැදි ලෙස භාවිතයේ යෙදෙන්නේ තමන් පමණක්ම බවත් නිතර දොඩවන අවස්ථාවාදීන් පිළිබඳව ලෙනින් උපහාසය මුසු කරමින් මෙසේ පැහැදිලි කරයි:

*"විප්ලවවාදී වාග් පාඨ දෙඩවීම විප්ලවවාදී පක්ෂවල රෝගයක් වන්නේ බොහෝ විට එම පක්ෂ නිර්ධන පංතියේ සහ සුළු ධනපති කොටස්වල සංයෝජනයක්, සන්ධානයක්, අන්තර් සම්බන්ධයක් ඇති කිරීමට නියම ලෙස හෝ අනියම් ලෙස සමන්විත වන විට ය. එමෙන්ම විප්ලවීය සිද්ධීන්ගේ ක්‍රියාදාමය විශාල ක්ෂණික වංගුවලට වැටෙන විට ය. සිද්ධීන්වල නියමිත වෙනස්වීමක් ඇති වූ විට දීත් එම වේලාවේ දී, නියමිත තත්ත්වයන් ඇති වූ විට දීත්, පැනනඟින වාස්තවික කොන්දේසි නොතකා විප්ලවවාදී උද්‍යෝග පාඨ පුනරුච්චාරණය කිරීම විප්ලවවාදී වාග් පාඨ දෙඩවීමක් වන්නේ ය. මේ උද්‍යෝග පාඨ ඉතා අනර්ඝ ය, සිත් ඇදගන්නාසුලු ය, මත් කරවනසුලු ය. නමුදු, ඒවාට උචිත පදනම් නොමැත. විප්ලවවාදී වාග් පාඨයේ හරය එය ය."*

*(ලෙනින් - විප්ලවවාදී වාග් පාඨ - 23 පිටුව)*

*"කුෂ්ඨය වේදනාසහගත රෝගයකි. විප්ලවවාදී වාග් පාඨ දෙඩවීම නමැති කුෂ්ඨ රෝගයට මිනිසුන් ගොදුරු වූ විට එම රෝගය දෙස බැලීමෙන් පවා ඉවසිය නොහැකි වේදනාවක් හට ගනී.*

*(ලෙනින් - විප්ලවවාදී වාග් පාඨ - 35 පිටුව)*

විප්ලවවාදී ව්‍යාපාරයක් විසින් න්‍යාය භාවිතාවට නැඟීමේ දී අඩුපාඩුකම් සිදු විය හැකි බව තේරුම් ගත යුතු ය. අප ප්‍රවේසම් විය යුත්තේ මූලධාර්මික වැරැදි දැනුම්වත්ව නොකිරීමට ය. විප්ලවවාදී ව්‍යාපාරයක භාවිතාවේ දී විවිධ අඩුපාඩුකම් සිදු වන අතර, විප්ලවය වර්ධනය වන්නේ එවැනි ගමන් මඟක් තුළ ය. සර්ව සම්පූර්ණ පක්ෂ හෝ පුද්ගලයන් නොමැත. විප්ලවවාදී පක්ෂවල ගමන්මඟ තුළ පක්ෂවලින් මෙන්ම පුද්ගලයන් අතින් ද අඩුපාඩු සිදුවිය හැකි ය. ඒවා තේරුම්ගත යුත්තේත්, ඒවා නිවැරැදි කිරීමට අරගල කළ යුත්තේත් අදේශපාලනිකව නොව දේශපාලන අවබෝධය සහිතව ය.

අවශ්‍ය නිසි මොහොතේ සටන් කිරීම මෙන්ම පසුබැසීමේ ද වැදගත්කම ගැන ලෙනින් මෙසේ අවධාරණය කරයි:

*"විප්ලවවාදී පක්ෂවලට ඒවායේ අධ්‍යාපනය සම්පූර්ණ කරගැනීමට සිදු වේ. ඔවුහු පහර දෙන ආකාරය ගැන උගෙන ගනිමින් සිටියහ. එවැනි දැනුමට අමතරව ක්‍රමානුකූල ලෙස පසුබසින්නේ කෙසේද යන්න ගැන ද දැන් දැනුම ලබාගත යුතු බව අවබෝධ කර ගැනීමට ඔවුන්ට සිදු වේ. නිසි ලෙස පහර දීමටත්, පසුබැසීමටත් යමෙක් උගෙන ගෙන නොමැති නම්, ජය ගැනුමක් කිසිසේත් නොවන බව වටහා ගැනීමට ඔවුන්ට සිදු විය. විප්ලවවාදී පංතිය මෙම කරුණ වටහා ගැනීමට උගෙන ගන්නේ අමිහිරි අත්දැකීම් තුළිනි."*

*(ලෙනින් - තෝරාගත් කෘති - 10 වෙළුම, 138 පිටුව)*

*"කුණු කැදලි උඩට මතු වන්නේ නැතිව, කපටියන් සහ සොරුන් පුචානම්කාරයන් සහ පුහු කතාකාරයන් නුපුරුදු නවීකාරකයන් කෙරෙහි එල්බ ගැනීමක් නැතිව, නුවමනා කැළඹිලි, අනුවණ ක්‍රියා හා දනිපනි ගැම් රහිතව, තනි 'නායකයන්' වැඩ විස්සක් එක වරම කිරීමට උත්සාහ දරා ඉන් එකක්වත් අවසන් නොකර තැබීම නොමැතිව ඉතිහාසයේ ගැඹුරු හා දැවැන්ත පොදුජන ව්‍යාපාරයක් කිසි කලෙකත් සිදු වූයේ නැත."*

*(ලෙනින් - තෝරාගත් කෘති - 08 වෙළුම, 60 පිටුව)*

07 පිටුවට



*"ඕනෑම සමාජයක එහි සාමාජිකයන් සමහර දෙනෙකුගේ ආයාසයන් තවත් සමහරෙකුගේ ආයාසයන් සමග ගැටෙන බවද සමාජ ජීවිතය ප්‍රතිවිරෝධයන්ගෙන් පිරී පවතින බවද ජාතීන් හා සමාජයන් අතර මෙන්ම ජාතීන් සහ සමාජයන් ඇතුළතද වන අරගලයන් ඉතිහාසයෙන් අනාවරණය වන බවද ඊට අමතරම විප්ලවයේ හා ප්‍රතිගාමීත්වයේත්, සාමයේ හා යුද්ධයෙත් නිශ්චලනයේ හා සීඝ්‍ර ප්‍රගතියේ හෝ අවනතියේත් කාලයන් මාරුවෙන් මාරුවට එන බවද පොදුවේ දත් දෙයකි. අවුල් ජාලයත් හා ව්‍යාකූලත්වයක් සේ පෙනෙන මෙය පාලනය කෙරෙන නියාමයන් සොයා ගැනීමට මාක්ස්වාදීන් මාර්ගදේශකත්වය එනම් පංති අරගලය පිළිබඳ න්‍යාය සපයා ඇත."*

**(ලෙනින්, තෝරා ගත් කෘති, 1 වැනි වෙළුම, 22-23 වැනි පිටු.**